# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මධ්‍ය අදායම් නිවාස ව්‍යාපෘතියේ පහත සඳහන් තනතුරු සඳහා වසරක (01) කොන්ත්‍රාත් කාලයකට බඳවාගැනීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| **ගෘහ නිර්මාණ ශිල්පී (කොන්ත්‍රාත්)** | **01** |
| **ඉංජිනේරු (සිවිල්/ විදුලි) (කොන්ත්‍රාත්)** | **02** |
| **ප්‍රමාණ සමීක්ෂක (කොන්ත්‍රාත්)** | **01** |
| **නගර සැලසුම්කරු  (කොන්ත්‍රාත්)** | **01** |
| **කණිෂ්ඨ ප්‍රමාණ සමීක්ෂණ (කොන්ත්‍රාත්)** | **01** |

**බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :**
**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ආ)තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(ඇ) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් :**

- **ගෘහ නිර්මාණ ශිල්පී(කොන්ත්‍රාත්)**

1.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගෘහ නිර්මාණ ශිල්පය පිලිබඳ උපාධිය ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

| | |
|---|---|
| තනතුරට අදාළ මාසික දීමනාව | : රු.63,725.00 |
| වයස් සීමාව | : අවු 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අයවිය යුතුය. |
| වෙනත් ප්‍රතිලාභ | :*ආයතනයෙන් 12% ක සේ.අ.අ.(EPF) හා 3% ක සේ.භා.අ.(ETF) දායකත්වය<br>*කළමනාකරණ සේවා චක්‍රලේක අංක 01/2024 අනුව අනුමත රු.10,000 ජීවන වියදම් දීමනාව සහ රජය සහ ආයතනය සඳහා අනුමත තනතුරට හිමි වෙනත් ප්‍රතිලාභ. |

- **ඉංජිනේරු (සිවිල්/ විදුලි) (කොන්ත්‍රාත්)**

**1.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු/ විදුලි ඉංජිනේරු උපාධිය ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

| | |
|---|---|
| තනතුරට අදාළ මාසික දීමනාව | : රු.63,725.00 |
| වයස් සීමාව | : අවු 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අයවිය යුතුය. |
| වෙනත් ප්‍රතිලාභ | :*ආයතනයෙන් 12% ක සේ.අ.අ. (EPF) හා 3% ක සේ.භා.අ. (ETF) දායකත්වය.<br>* කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව අනුමත රු.10,000 ජීවන වියදම් දීමනාව සහ රජය සහ ආයතනය සඳහා අනුමත තනතුරට හිමි වෙනත් ප්‍රතිලාභ. |

- **ප්‍රමාණ සමීක්ෂක (කොන්ත්‍රාත්) (පහත 1 හෝ 2)**
  1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ උපාධිය ලබා තිබීම.

     **සමඟ**

     අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

  2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

     **සමඟ**

     සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

| | |
|---|---|
| තනතුරට අදාළ මාසික දීමනාව | : රු.60,975.00 |
| වයස් සීමාව | : අවු 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අයවිය යුතුය. |
| වෙනත් ප්‍රතිලාභ | :*ආයතනයෙන් 12% ක සේ.අ.අ. (EPF) හා 3% ක සේ.භා.අ. (ETF) දායකත්වය.<br>*කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව අනුමත රු.10,000 ජීවන වියදම් දීමනාව සහ රජය සහ ආයතනය සඳහා අනුමත තනතුරට හිමි වෙනත් ප්‍රතිලාභ. |

- **නගර සැලසුම්කරු (කොන්ත්‍රාත්) (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4)**
  1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නගර හා ග්‍රාම නිර්මාණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.
  2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත් (07) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
  3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හය (06) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක,මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.
  4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පහ (05) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක,මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

| | |
|---|---|
| තනතුරට අදාළ මාසික දීමනාව | : රු.50,400.00 |
| වයස් සීමාව | : අවු 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අයවිය යුතුය. |
| වෙනත් ප්‍රතිලාභ | :ආයතනයෙන් 12% ක සේ.අ.අ. (EPF) හා 3% ක සේ.භා.අ. (ETF) දායකත්වය<br>* කළමනාකරණ සේවා චක්‍රලේක අංක 01/2024 අනුව අනුමත රු.10,000 ජීවන වියදම් දීමනාව සහ රජය සහ ආයතනය සඳහා අනුමත තනතුරට හිමි වෙනත් ප්‍රතිලාභ. |

- **කණිෂ්ඨ ප්‍රමාණ සමීක්ෂණ (කොන්ත්‍රාත්) (පහත 1 හෝ 2 හෝ 3හෝ 4)**
  1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රමාණ සමීක්ෂණය පිලිබඳ උපාධිය ලබා තිබීම.
  2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත් (07) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
  3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හය (06) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක,මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.
  4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පහ (05) වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක,මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම

| | |
|---|---|
| තනතුරට අදාළ මාසික දීමනාව | : රු.50,400.00 |
| වයස් සීමාව | : අවු 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි අයවිය යුතුය. |
| වෙනත් ප්‍රතිලාභ | :ආයතනයෙන් 12% ක සේ.අ.අ. (EPF) හා 3% ක සේ.භා.අ. (ETF) දායකත්වය<br>*කළමනාකරණ සේවා චක්‍රලේක අංක 01/2024 අනුව අනුමත රු.10,000 ජීවන වියදම් දීමනාව සහ රජය සහ ආයතනය සඳහා අනුමත තනතුරට හිමි වෙනත් ප්‍රතිලාභ. |

සම්පූර්ණ කරන ලද ජීව දත්ත පත්‍රිකාව අදාළ සහතිකවල පිටපත් සමඟින් 2024.05.29 දින හෝ ඊට පෙර **admnusda@gmail.com** E-mail ලිපිනයට යොමු කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
09 වන මහල
සෙත්සිරිපාය, බත්තරමුල්ල
දුරකතනය : 011- 2871305